www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ඇමරිකානු ඇක්සල් වැඩ වර්ජනයෙන් ලත් දේශපාලන පාඩම්

## The political lessons of the American Axle strike

**ලෝක සමාජවාදී වෙබ් අඩවියේ හා සමාජවාදී සමානතා පක්ෂයේ ප්‍රකාශය**
**2008 මැයි 31**

මිචිගන් හා නිව් යෝර්ක්හි තෙමසක් සේවයෙන් ඉවත්ව සිටීමෙන් පසුව ඇමරිකානු ඇක්සල් කම්කරුවෝ මේ සතිය මුලදී ආපසු සේවය ආරම්භ කලහ. දශක ගනනාවක් තුල මෝටර් රථ කර්මාන්තයෙහි සේවයෙන් ඉවත්ව සිටීමේ දිගු ම අරගලය වූ මෙය කම්කරුවන්ට වේදනාකර පරාජයක් අත් කර දෙමින් අවසන් විය.

ඩෙට්රොයිට්හි 1200ක් ඇතුලුව, සේවයට ආපසු පැමිනෙන කම්කරුවන්ගෙන් අඩකට වැඩි කොටසකට සිය රැකියා අහිමි වනු ඇත. ඉතිරිවන අයට ගෙවන වැටුප පැයකට ඩොලර් 28 සිට පැයකට ඩොලර් 18.50ක් දක්වා අඩුවනු ඇත. ඇතැම් ස්ථානවල ගෙවන වැටුප පැයකට ඩොලර් 10ක තරම් අඩු මට්ටමක පවතිනු ඇත. සමස්තයක් වශයෙන් නව ගිවිසුමෙන් ශ්‍රම පිරිවැය සියයට 50 කින් අඩු වනු ඇතැයි සංස්ථා ප්‍රධාන විධායක නිලධාරී රිචඩ් බෝම් බදාදා වෝල්ස්ට්‍රීට් ආයෝජකයින්ගේ සම්මේලනයක් කැඳවමින් කියා සිටියේය. "එමගින් සමාගමට ඩොලර් මිලියන 300ක් ඉතිරි වනු ඇත. මේ සියලු ඉලක්ක අපට මුදුන්පමුනුවා ගැනීමට හැකිව ඇති බව මම සතුටින් වාර්තා කරමි" යි ඔහු උදම් ඇනීය.

පිලිකුලට ලක්වූ කොන්ත්‍රාත්තුව සියයට 78ක ප්‍රතිශතයකින් ස්ථිර කෙරින. කම්කරුවන් තව දුරටත් වැඩ වර්ජනයෙහි යෙදී සිටියේ නම්, ඔවුනට වැඩි යමක් දිනා දීමට එක්සත් මෝටර් කම්කරුවන්ගේ (යූඒඩබ්ලිව්) වෘත්තීය සමිතියට ඇති හැකියාව පිලිබඳ විශ්වාසය භංග වීම පිලිබඳව මෙය සාක්ෂ්‍ය දරයි. සේවයෙන් පිටවී යාම ඇරඹීමටත් ප්‍රථමයෙන් යූඒඩබ්ලිව් වෘත්තීය සමිතිය සැලකිය යුතු වැටුප් කැපීමක් පැනවීමට සිය කැමැත්ත පල කර තිබුනි. ඉන්පසු වෘත්තීය සමිතිය දින 87ක් තිස්සේ පිකට් වැටවල කම්කරුවන් හුදෙකලා කර සතියකට ඩොලර් 200ක් වැනි අල්ප වැඩ වර්ජන ගෙවීමක් ලබාදුන්නේ ය. අවසනදී, යූඒඩබ්ලිව් සමාගම සමග මුලින් එකඟ වූ ගිවිසුම ආපසු ගෙන එමින් "එය භාරගන්නා ලෙස හෝ භාර නොගන්නා ලෙස" කම්කරුවන්ට කියා සිටියේය.

විකල්පයක් නොමැති වීමේ තත්වය තුල කම්කරුවෝ ගිවිසුමට පක්ෂව ඡන්දය දුන්හ. වැඩි දෙනෙක් දැන්ම හෝ නුදුරු අනාගතයෙහි දොට්ට වැටීමේ විකල්පය තෝරා ගත්හ. දොට්ට වැටුනු මෝටර් රථ කම්කරුවන් බොහෝ දෙනෙක් මිචිගන් නගරය හැර යන පිරිසට එකතු වන බවට සැකයක් නැත. 1999 වසරේ සිට මිචිගන්හි මෝටර්රථ කර්මාන්තයෙහි රැකියා 143,000 නැතහොත් මුලු රැකියා ප්‍රමානයෙන් සියයට 45ක් අහෝසි වී ඇත.

ඇමරිකානු ඇක්සල්හි යූඒඩබ්ලිව් පාවාදීම - එයට කලින් ඩෙල්ෆි හා බිග් ත්‍රී සමාගම් වෙත ලබා දුන් සහන මෙන් - නිත්‍ය වැටුප් අඩු කිරීමක් සඳහා නව ප්‍රමිතියක් සකස් කිරීමට ප්‍රයෝජනයට ගනු ඇත. ඉහල තෙල් මිල ගනන් නය සීමා කිරීම් හා අලෙවිය පහත වැටීම අත් විඳි ජෙනරල් මෝටර්ස් හා ෆෝඩ් සමාගම් සැහැල්ලු ට්‍රක්රථ හා එස්යූවී නිෂ්පාදනය තියුනු ලෙස කපා හරින බවට දැනටමත් නිවේදනය කොට ඇත.

මෙය මෝටර්රථ හා ගුවන් කර්මාන්තවල හා එක්සත් ජනපද ආර්ථිකයේ ඉතිරි කොටස්හි විශාල වශයෙන් සේවය අත්හිටුවීම්, බංකොලොත්භාවයන් හා සහන ලබා දෙන ලෙස කෙරෙන ඉල්ලීම්වල නව වටයක ප්‍රාරම්භයක් පමනි. මෝටර් රථ කර්මාන්තය වැඩි පහසුකම් හෝ රැකියා සුරක්ෂිත භාවය රහිත අඩු වැටුප් ගෙවන අංශයක් බවට පත් වන තෙක් සංස්ථා විධායක නිලධාරින් හා ආයෝජකයින් සෑහීමකට පත් වන්නේ නැත.

යූඒඩබ්ලිව් හා ඒඑෆ්එල්සීඅයිඕ වෘත්තීය සමිති තව දුරටත් කම්කරු පන්ති සංවිධාන නොවන බවට ද, මෙම ව්‍යාපාරික ගැති සංවිධානවලින් කැඩී කම්කරුවන් කැඩී වෙන් විය යුතු බවට ද අවධාරනය කිරීම සම්බන්ධායෙන් නොයෙකුත් මධ්‍යම පන්තික වම්මුන් විසින් සමාජවාදී සමානතා පක්ෂය විවේචනයට ලක් කොට ඇත. මෙය 1990 ගනන්වල මුල්භාගයේ සිට අප පක්ෂය විසින් ගන්නා ලද ස්ථාවරයකි. එසේ වුව ද ඇමරිකානු ඇක්සල් වැඩ වර්ජනයෙහි ප්‍රතිඵලය හා දශක තුනකට ආසන්න

කාලයක් තුල වෘත්තීය සමිතිවල සමස්ත ගමන් මාවත ම මෙම ස්ථාවරයෙහි නිවැරදිතාව විදහා දක්වයි.

වෘත්තීය සමිති නිලධාරි තන්ත්‍රය වෙනුවෙන් කම්කරු "වම්මු" පූර්න වශයෙන්ම තීරනාත්මක භූමිකාවක් ඉටු කරති. යූඒඩබ්ලිව් හා අනිකුත් වෘත්තීය සමිති ප්‍රතිසංස්කරනය කල හැකිය යන මුලාවන් දිරිගැන්වීමට ඔවුහු උත්සුක වෙති. වැඩ වර්ජනය පාවාදීමට එරෙහිව කම්කරුවන් මෙහෙයවීම සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් නොගන්නා හිටපු රැඩිකල්වාදීන් හා වෘත්තීය සමිති තුල විරුද්ධ මත දරන අය - ඩෙට්රොයිට් ඇමරිකානු ඇක්සල් කම්හලේ හිටපු ප්‍රාදේශීය වෘත්තීය සමිති සභාපති හා කම්කරු විත්ති පුවත්පතෙහි ආධාරකරුවකු වන වෙන්ඩි තොම්ප්සන් ද මෙයට ඇතුලු වේ - දිගින් දිගට ම යූඒඩබ්ලිව් වෘත්තීය සමිතියේ ආධිපත්‍යය අනුමත කරති. එසේ කරනුයේ සටන් කරන ලෙස වෘත්තීය සමිති නායකයන්ට පීඩනය එල්ල කිරීම තුලින් වැඩ වර්ජනය දිනාගත හැකිය යන්න කියා පාමිනි.

අවසන දී, මේ පුද්ගලයින් ක්‍රියාත්මක වන්නේ කම්කරුවන් සූරාකෑමෙහි යෙදෙන ප්‍රතිගාමී සංවිධානවල දේශපාලන ඒජන්තවරුන් වශයෙනි. 1980 මුල් භාගයෙන් පසුව සෑම වසරක්ම පාසා අවසනක් නැති පාවා දීමේ වැඩ වර්ජන දාමයක් ඇති වී තිබේ. එනමුදු, වර්කර්ස් වර්ල්ඩ්, ඉන්ටර්නැෂනල් සෝෂලිස්ට් ඕර්ගනයිසේෂන් සහ ස්පාර්ටසිස්ට් ලීගය වැනි කන්ඩායම් ඒ තුලින් කිසි දිනෙක නිගමනවලට එන්නේ නැත.

වෘත්තීය සමිතිවාදය - සහ ධනවාදය ප්‍රතිසංස්කරනය කිරීමේ එහි ඉදිරි දර්ශනය - තවමත් සාධ්‍ය එකකැයි ඔවුහු සැවොම අවධාරනය කරති. ධනේශ්වර පද්ධතියට සමාජවාදී විකල්පයක් වෙනුවෙන් කම්කරුවන් සඳහා දේශපාලන ව්‍යාපාරයක් ගොඩනැගීමට සටන් කිරීමේ අවශ්‍යතාව ඉතාම සුබවාදීව සලකතොත් ඔවුනට නම් අලංකාරොක්තියකි.

එනමුදු, නිශ්චිතව ම අවශ්‍යවන්නේ ද මෙයයි. ඇමරිකානු ඇක්සල් වැඩ වර්ජනය එක්සත් ජනපදයෙහි හා ජාත්‍යන්තර වශයෙන් කම්කරු පන්තියේ වඩාත් පුලුල්වූ අරගලයක කොටසකි. එය සිදුවෙමින් පවතින්නේ ලෝක ධනේශ්වර පද්ධතියෙහි පෙර නොවූ විරූ අර්බුදයක තතු තුලය.

දස ලක්ෂ සංඛ්‍යාත කම්කරුවෝ, සිය නිවෙස් වෙන්දේසියේ දැමීමට ද, රැකියා හා ජීවන තත්වයන්ට එරෙහි ප්‍රහාරවලට ද, ගෑස්, ආහාර හා අනිකුත් ජීවන වියදම්වල දැඩි මිල උද්ධමනයට ද මුහුන දෙති. මේ සියල්ල, ධනවාදයේ බංකොලොත්බවෙහි, ලොව පුරා වෙසෙන කම්කරු ජනතාවගේ අවශ්‍යතාවන් ලාභ ඉල්ලුමට යට කර දමන ආර්ථික හා දේශපාලන පද්ධතියෙහි ද සංගත හා මූල්‍ය ප්‍රභූවේ වඩ වඩාත් විශාල වන සුපෝෂනයෙහි විද්‍යමානවීම් ය.

වෘත්තීය සමිති ප්‍රතිසංස්කරනවාදයට ශුභදායක කාලයක් පැවතියේ පශ්චාත් දෙවැනි ලෝක සංග්‍රාම කාලය තුල ය. එකල, එක්සත් ජනපද කර්මාන්ත ලෝක වෙලඳපොල පාලනය කල අතර ජපානය හා ජර්මනිය තවමත් යුද සමයේ හි අත් විඳි විනාශයන්ගෙන් ගොඩ එමින් සිටියේය. ඩිමොක්‍රැටික් පක්ෂයෙන් නිශ්චිතව කැඩී වෙන්වීයාම හා ධනේශ්වර පද්ධතියට එරෙහිව දේශපාලන අරගලයක යෙදීම නිශ්චිතවම ප්‍රතික්ෂේප කල රොයිතර් හා අනිකුත් යූඒඩබ්ලිව් වෘත්තීය සමිති නායකයන් කම්කරු පන්තියේ අනාගතය සඳහා ඔට්ටු ඇල්ලුවේ ඇමරිකානු මහා ව්‍යාපාරවල ආධිපත්‍යය තව දුරටත් පවත්වාගැනීම මතය.

කම්කරුවන්ගේ හා සංගතවල ලාභාපේක්ෂා ප්‍රතිසන්ධාන කල හැකිය යන ප්‍රකාශය 1980 ගනන්වල පුපුරා හැරිනි. එකල එක්සත් ජනපදයෙහි ඓතිහාසික පිරිහීමට ප්‍රතිචාර වශයෙන් සංස්ථාමය ඇමරිකාව එක්සත් ජනපද කම්කරුවන්ගේ රැකියා හා ජීවන තත්වයන් මත ප්‍රහාර මාලාවක් දියත් කලේ ය. එය අද දින දක්වා පවත්වාගෙන යනු ලැබේ.

ජපන් හා යුරෝපීය ප්‍රතිමල්ලවයන් ඉදිරියේ එක්සත් ජනපද ආර්ථිකය වඩවඩාත් පසුබසිත්ම, බලගතු මූල්‍යමය උවමනාකම් තිබූ අය හිතාමතාම කර්මාන්තකරනයෙන් ඉවත්වීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කලහ. ඒ තුලින් 1979 වසරේ සිට නිෂ්පාදන අංශයේ මිලියන 5ක රැකියා විනාශ වීමටත් ඇමරිකානු කම්කරුවන්ගේ ජීවන තත්වයන් මත අනුකම්කා විරහිත ප්‍රහාරයක් එල්ල කිරීමටත් මග පෑදුනි. නිවාස හා අවමුඛ උකස් බුබුල ඇතුලුව, නොයෙකුත් මූල්‍ය සමපේක්ෂනවල ආයෝජනය සඳහා ලාභ නොලබන කර්මාන්තවලින් ප්‍රාග්ධනය නිදහස් කිරීම මෙහි එල්ලය විය.

ඒ සමග ම එක්සත් ජනපද සංගත නිෂ්පාදනය අඩු වැටුප් ප්‍රදේශ කරා මාරු කරනු ලැබුවේ පිරිවැය කැපීම, සිය විදේශීය ප්‍රතිමල්ලවයන්ට එරෙහිව තරග කිරීම, ලතින් ඇමරිකාවෙහි හා ආසියාවෙහි දිළිඳු කම්කරුවන් සූරාකෑමෙන් ඉමහත් ලාභ සහතික කර ගැනීම සඳහාත් ය. නිදසුනක් වසයෙන්, ඇමරිකානු ඇක්සල් සමාගම, මෙක්සිකෝවේ ගුවානාජුවාටෝහි කම්හලක් විවෘත කලේය. එහි කම්කරුවන්ට ගෙවන දෛනික වැටුප පෙසෝ 130ක්, හෝ ඩොලර් 12.50ක් පමනි.

1994 වසරේදී සමාගම භාරගැනීමෙන් අනතුරුව ඩොලර් මිලියන 250ක් සිය සාක්කුවේ ලා ගත් සංස්ථා ප්‍රධාන විධායක නිලධාරි වූ රිචඩ් ඩෝච්, කම්කරු පන්තියේ වියදමෙන් සෘජු වාසි ලබා ඇති සමාජ සංකේතයක් බඳුය.

පසුගිය දශක තුන පුරා එක්සත් ජනපදයෙහි ශුද්ධ ආදායම් ප්‍රතිලාභවලින් සියයට 8ක ප්‍රතිශතයක් ලැබී ඇත්තේ එහි ජනගහනයෙන් පොහොසත්ම සියයට 1ක ප්‍රතිශතයකට ය. 1928 වසරින් පසුව, ජාතික ආදායමෙන් විශාලතම කොටස පාලනය කරන්නේ මේ සියයට 1 ය. මේ 3,000,000ක් දෙනා - ඔවුන්ගේ ආදායම් සාමාන්‍යය ඩොලර් මිලියන 1.1 කට නැග ඇත - සාමූහිකව, පහලම ස්ථරයේ ඇමරිකානුවන් මිලියන 150 ලැබූ ආාදායමට ආසන්න ප්‍රමානයක් භුක්ති විඳී. ආදායම් බදු දත්තවලට අනුව, තනි පුද්ගලයෙකු ගත් කල, පහලම භාගයේ සාමාන්‍ය පුද්ගලයෙකු මෙන් 440ක ගුනයක ආදායමක් ලැබූහ. 1980 වසරේ සිට මේ පරතරය දෙගුනයකට ආසන්නව වැඩිවී ඇත.

වැඩ වර්ජනය ඇරඹී වැඩි කලක් යන්නට මත්තෙන්, කම්කරුවන් සිය ඉල්ලීම් පිලිනොගතහොත් එක්සත් ජනපදයෙහි සිය කම්හල් වසාදමා නිෂ්පාදනය අඩු වැටුප් ගෙවන රටවලට ගෙන යාමට ඩෝව් තර්ජනය කලේ ය. යූඒඩබ්ලිව් වෘත්තීය සමිතිය ධනේශ්වර ක්‍රමය පූර්න වශයෙන් පිලිගන්නා නිසා මේ ආර්ථික කප්පම් ඉල්ලීමට පිලිතුරක් නැත.

කම්කරු පන්තියේ ජාත්‍යන්තර එකමුතුව වෙනුවෙන් සටන් කිරීමට නොකැමැති හා අපොහොසත්වූ යූඒඩබ්ලිව් වෘත්තීය සමිතිය එක දිගට වඩා අඩු වැටුප් හා වඩා අයහපත් සේවා තත්වයන් පිලිගැන්වීම තුලින් එක්සත් ජනපදයෙහි රැකියා අවම ප්‍රමානයක් පවත්වා ගෙන යෑමට සමාගම ඒත්තු ගැන්වීමට උත්සුක විය. එක්සත් ජනපදයෙහි වෘත්තීය සමිති නොමැති කම්හල්වල යූඒඩබ්ලිව් වෘත්තීය සමිතිය පිලිගැනීමටත් සමිතිය වෙනම වැටුප් ගිනුම් අත්සන් කල මිචිගන් හා ඔහියෝහි පිහිටි කම්හල්වල නිෂ්පාදනය පුලුල්වීම පිලිගැනීමටත් සමාගම විසින් දී ඇති සහතික වාර්තාවන පරිදි නව ගිවිසුමට ඇතුලු වේ. වාර්තා වන පරිදි මෙහි ගෙවන්නේ පැයට ඩොලර් 20ක් වැනි අඩු වැටුපකි. කම්කරුවන් දරිද්‍රතා මට්ටමේ වැටුප් ලැබුව ද යූඒඩබ්ලිව් වෘත්තීය සමිති නිලධාරි තන්ත්‍රයට එයිනුත් වෘත්තීය සමිතියට ගෙවිය යුතු මුදල දිගින් දිගටම අය කර ගැනීමට හැකිවීම මින් සහතික කෙරේ.

යූඒඩබ්ලිව් වෘත්තීය සමිතිය ධනේශ්වර ක්‍රමයට සහාය වීමේ කූටප්‍රාප්තිය, එයම ලාභ ලබන ව්‍යාපාරයක් බවට පරිවර්තනය වීමයි. පසුගිය වසර තුල වෘත්තීය සමිති සාමාජිකත්වය 70,000කට අධික ප්‍රමානයකින් අඩුවත්ම, කම්කරුවන් වැඩි වැඩියෙන් රැකියා අහිමිවීම් හා වැටුප් අඩුවීම් අත්විඳිත්ම සිය ආයෝජන තුලින් වෘත්තීය සමිතිය සිය ආදායම වැඩි කරගත්තේ ය.

ජෙනරල් මෝටර්ස්, ෆෝඩ් හා ක්‍රයිස්ලර් සමාගම්හි පසුගිය වසරෙහි යූඒඩබ්ලිව් වෘත්තීය සමිතිය විසින් පිලිගන්නා ලද ශ්‍රේනි දෙකකින් සමන්විත වැටුප් ගිවිසුමට හුවමාරු වශයෙන් ඩොලර් බිලියන ගනනාවකින් යුතු විශ්‍රාමික භාරකාර අරමුදලක හා ජෙනරල් මෝටර්ස් හා ෆෝඩ් හි ව්‍යාපාර වස්තුවලින් ඩොලර් දස මිලියන ගනන්වල පාලනයක් වෘත්තීය සමිතියට භාර දෙන ලදී. යූඒඩබ්ලිව්හි නායකත්වයේ වැජඹෙන ව්‍යවසායකයින්ට දිගින් දිගටම මෝටර් රථ කම්කරුවන්ගේ රැකියා හා ජීවන තත්වයන්ට පහර එල්ල කිරීමට ඍජු මූල්‍යමය අනුබලයක් මින් සැපයෙනු ඇත.

කම්කරු පන්තියේ අවශ්‍යතාවන් ආරක්ෂා කිරීම අතින් යූඒඩබ්ලිව් වෘත්තීය සමිතිය වැදගැම්මකට නැති දෙයක් බව ප්‍රදර්ශනය කර ඇත. එය කම්කරු පන්ති සංවිධානයක් නොව, ඉහල මධ්‍යම පන්තික තට්ටුවක් මගින් පාලනය කරන ලද සංවිධානයකි. මොවුන්ගේ අවශ්‍යතා මතුපිටින් පෙනෙන පරිදි ඔවුන් නියෝජනය කරන්නේ යයි කියැවෙන සාමාජිකයන්ගේ අවශ්‍යතාවලට පටහැනි ය.

විවිධාකාර වම්මුන් විසින් ප්‍රකාශිත පරිදි, මෙහි ඇත්තේ හුදෙක්ම ඇතැම් වෘත්තීය සමිති නිලධාරින්ගේ පෞද්ගලික දූෂනය හෝ සටන් කිරීමට ඇති අධිෂ්ඨානයේ අඩුවක් පිලිබඳ ප්‍රශ්නයක් නොවේ. සාකච්ඡාවට භාජනය වන ප්‍රශ්නය වනුයේ ධනේශ්වර ක්‍රමයට කම්කරුවන් යටත් කිරීමෙහිලා වෘත්තීය සමිතියේ භූමිකාවයි. එහි දේශපාලන හැඩ ගැසීම ඩිමොක්‍රටික් පක්ෂයට සහාය වීමයි.

කම්කරුවන් සමාගම්වලට පක්ෂ වූ මෙම සංවිධානවලින් කැඩී වෙන්වී අරගල කිරීමේ සංවිධාන ගොඩනැගිය යුතු ය. අන් සියල්ලටම වඩා, කම්කරුවන් සංවිධානය විය යුත්තේ හුදෙක්ම සිය වැඩ කරන ස්ථානයේ පදනම මත නොව, ජාත්‍යන්තර පන්තියක් වශයෙනි. එහි පොදු අවශ්‍යතාව වනුයේ සුලු ධනවතුන් පිරිසකගේ අවශ්‍යතාවන් සපුරාලීම සඳහා නොව, සමාජයේ බහුතරයේ අවශ්‍යතාවන් සපුරාලීම සඳහා, ආර්ථික හා දේශපාලනමය දිවිය ප්‍රතිසංවිධානය කිරීමය.

ගෝලීය මෝටර්රථ කර්මාන්තය, කර්මාන්ත ශාලා කම්කරුවන්, ඉංජිනේරුවන්, විද්‍යාඥයින් හා අනිකුත් අය ඇතුලුව, දහ මිලියන ගනන් වැඩ කරන ජනතාවගේ සාමූහික ශ්‍රමය සම්බන්ධ කර ගනී. ලොවෙහි සම්පත්වලින් දැවැන්ත ප්‍රමානයක් එය පරිභෝජනය කරයි. මේ ව්‍යවසායේ භාරකාරිත්වය, සංස්ථා විධායක නිලධාරින්, ආරක්ෂිත අරමුදල් කලමනාකරුවන් හා අනිකුත් මූල්‍ය සමපේක්ෂකයින් අත තබා පසෙකට වී සිටිය නොහැක. ඔවුන්ගේ එකම අවශ්‍යතාව වන්නේ සුරක්ෂිත හා ඔරොත්තු දෙන ගමනාගමන ක්‍රමයක් සැපයීම නොව, සිය පෞද්ගලික සම්පත් තර කර ගැනීමයි. එමගින් මානව ශ්‍රමය හා අත්‍යවශ්‍ය සම්පත් දැවැන්ත ප්‍රමානයකින් නාස්තිකර දැමීමට හා ඩෙට්රොයිට් හා බෆලෝ වැනි සමස්ත කාර්මික පුරවරයන් විනාශ කිරීමට මග පෑදී ඇත.

මෝටර් රථ කර්මාන්තය පෞද්ගලික ලාභය සඳහා නොව, පොදු යහපත තකා ක්‍රියාත්මක වීමට නම්, එය, සැලසුම්ගත සමාජවාදී ආර්ථිකයක් සංස්ථාපනය කිරීමේ කොටසක් වශයෙන්, වැඩ කරන ජනතාවගේ පොදු අයිතිය හා ප්‍රජාතන්ත්‍රීය පාලනය යටතට ගෙන ආ යුතුය. පරිගනකකරනයෙහි, රොබෝට විද්‍යාවෙහි හා නිෂ්පාදනය ජාත්‍යන්තර වශයෙන් ඒකාග්‍ර කිරීමේ ලා ඇතිවී තිබෙන විශාල දියුනුව සියලු දෙනාගේ ම යහපත සඳහා උපයෝගි කර ගත හැක්කේ හා ගමනාගමනය නිර්මානය කරන්නවුන්ගේ දිවි පෙවෙත සුරක්ෂිත කර ගත හැක්කේ එමඟින් පමනි.

එවැනි වැඩපිලිවෙලක් ඩිමොක්‍රැටික් පක්ෂයට අතිශයින් පිලිකුල උපදවන එකකි. රිපබ්ලිකන් පක්ෂය මෙන්ම, ඩිමොක්‍රැටික් පක්ෂය ද ලාභ පද්ධතිය ආරක්ෂා කරයි.

යූඒඩබ්ලිව් වෘත්තීය සමිතියේ පාවාදීම එලඹෙන තෙක්ම ඩිමොක්‍රැටික් පක්ෂයේ ජනාධිපති අපේක්ෂකයින් දෙදෙනාම වැඩ වර්ජනය පිලිබඳව මුනිවත රැකීම වැදගත් ය. ඩෙට්‍රොයිට් ආසන්න නගරයක ප්‍රජා විද්‍යාලයක කරන ලද දේශනයකදී, වැඩ වර්ජකයින් කෙරේ තමන් තුල ඇතැයි කියන අනුකම්පාව, එක්සත් ජනපද මෝටර් රථ සමාගම්වල වැඩි දියුනු කරන ලද නවීකරනය හා තරගකාරීත්වයට ප්‍රශංසා කිරීම සමග සංයෝජනය කිරීමට ඔබාමා උත්සුක විය. එනමුදු, මෝටර් රථ කර්මාන්ත සමාගම් සිය තරගකාරී තත්වය දියුනු කර ගෙන ඇත්තේ මෝටර් රථ කම්කරුවන්ගේ රැකියා හා ජීවන තත්වයන් මත අනුකම්පා විරහිත ප්‍රහාරයන් එල්ල කිරීම තුලිනි.

එක් පැත්තකින් සංස්ථාපිත ඇමරිකාවේ හා වෝල් වීදියේ අවශ්‍යතා ද, අනික්පැත්තෙන් කම්කරු පන්තියේ අවශ්‍යතා ද ප්‍රතිසංන්ධානය කිරීම කල නොහැක්කකි. ඔබාමාට ධවල මන්දිරයට ඇතුලුවීමට හැකි වුව හොත් - අනෙකුත් සෑම ධනේශ්වර දේශපාලඥයෙකු මෙන්ම ඔහුද සහාය ලබන්නේ සංගත මුදල් වලිනි. - ඔහු ද මහා ව්‍යාපාර ආරක්ෂා කරමින් ඇමරිකානු ධනේශ්වරයෙහි අර්බුදය වෙනුවෙන් කැපකිරීමට කම්කරු පන්තියට බලකිරීමේ නිරත වනු ඇත.

ඇමරිකානු ඇක්සල් වැඩවර්ජනය ප්‍රදර්ශනය කලේ ඇමරිකානු සමාජයෙහි ද, ලොව පුරාම ද ඇති නොපෑහිය හැකි කේන්ද්‍රීය ගැටලුවයි; එනම්, පන්ති අරගලයයි. සිය පොදු අවශ්‍යතාවන් වෙනුවෙන් එක්සත් වී සටන් කිරීමට නම්, සමාජයේ ප්‍රමුඛතාවන්හි අති මූලික ප්‍රතිසංවිධානයක් ඉලක්ක කොට ගත් දේශපාලන ව්‍යාපාරයක් සමග කම්කරු පන්තිය ඒකාබද්ධ විය යුතුය.

කම්කරු පන්තියේ අවශ්‍යතා - සාධාරන වැටුප් සහිත රැකියා, සෞඛ්‍ය පහසුකම්, අධ්‍යාපනය, නිවාස හා යුද්ධයෙන් මිදුනු ලොවක් සඳහා - පෞද්ගලික ලාභය වෙනුවෙන් කොරෙන ආත්මාර්ථකාමී හා විනාශකාරී ව්‍යාපාරයන්ට වඩා, ප්‍රමුඛ විය යුතු ය. මග පෙන්වන මූලධර්මය විය යුත්තේ මානව වර්ගයාගේ ඵලදායී සම්පත් සවිඥානකව හා තර්කාන්විතව ප්‍රයෝජනයට ගැනීම තුලින් සමාජ සමානතාව අරබයා සටන් කිරීම, දුප්පත්කම ඉවත් කිරීම හා ලොවෙහි ජනයාගේ ජීවන තත්වයන් ඉහල නැංවීමයි.

එක්සත් ජනපදයෙහි හා ජාත්‍යන්තර වශයෙන් කම්කරු ව්‍යාපාරයෙහි යලි පනගැන්විය හැකි එකම මග මෙම සමාජවාදී ඉදිරි දර්ශනය වෙනුවෙන් සටන් කිරීමයි. සමාජවාදී සමානතා පක්ෂයේ ඉතිහාසය හා වැඩ පිලිවෙල අධ්‍යයනය කර එයට බැඳීමට හා එය කම්කරු පන්තියේ නව විප්ලවකාරී නායකත්වය වශයෙන් ගොඩනැගීමට සහායවීමට තීරනය ගන්නා ලෙස අපි මෝටර් රථ කර්මාන්තයේ ද අවශේෂ සියලු කම්කරුවන්ගෙන් ද උදක්ම ඉල්ලා සිටිමු.

© www.wsws.org